# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

# විශ්වවිද්‍යාල ප්‍රවේශය

# 2021/ 2022 අධ්‍යයන වර්ෂය

## සාමාන්‍ය ප්‍රවේශය

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රවේදී (අභ්‍යන්තර) උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා 2019 වර්ෂයේ හා 2020 වර්ෂයේ පැවති අ.පො.ස. (උ. පෙළ) විභාගයට පෙනී සිටි හා ප්‍රාචීන මධ්‍යම විභාගයට පෙනී සිටි පහත සඳහන් **සුදුසුකම් ලබා ගත් වයස අවුරුදු 28 ට අඩු ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාගෙන් සහ ගිහි පිරිමි සිසුන්ගෙන් 2021/ 06/25 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.**

**බඳවා ගන්නා ආකාරය :**

2019 හා 2020 වර්ෂවල අ.පො.ස. (උ. පෙළ) විභාගයේදී ලබාගත් Z ලකුණුවල (Z Score) ප්‍රමුඛතාව සහ ප්‍රාචීන මධ්‍යම විභාගයේ ප්‍රතිඵල මත සම්මුඛ පරීක්ෂණයට ලක් කොට බඳවා ගනු ලැබේ.

- 2019 වර්ෂයේ අ.පො.ස. (උ. පෙළ) සිසුන්ට ප්‍රමුඛතාවය හිමි වේ.

**ඇතුළත් වීමට අවශ්‍ය අවම සුදුසුකම්**

1. නියමිත වර්ෂයේ අ.පො.ස. (උ. පෙළ) විභාගයේදී බෞද්ධ විෂය ක්ෂේත්‍රයේ විෂයක් (බෞද්ධ ශිෂ්ටාචාරය/ බුද්ධ ධර්මය) හා පාලි විෂය සහිතව විෂයන් තුනකින් සමත් වීම සමග සාමාන්‍ය පොදු ප්‍රශ්න පත්‍රයට 30% කට නොඅඩු ලකුණු ප්‍රමාණයක් ලබා තිබීම. **හෝ**
2. නියමිත වර්ෂයේ අ.පො.ස. (උ. පෙළ) විභාගයේදී සංස්කෘත හෝ ඉතිහාසය හෝ සිංහල සහ පාලි විෂය සහිතව විෂයන් තුනකින් සමත් වීම සමග සාමාන්‍ය පොදු ප්‍රශ්න පත්‍රයට 30% කට නොඅඩු ලකුණු ප්‍රමාණයක් ලබා තිබීම. **හෝ**
3. නියමිත වර්ෂයේ අ.පො.ස. (උ. පෙළ) විභාගයේදී පාලි විෂයට පෙනී නොසිටියේ නම් අ.පො.ස. (උ. පෙළ) බෞද්ධ විෂයක් (බෞද්ධ ශිෂ්ටාචාරය / බුද්ධ ධර්මය) සහ භාෂා විෂයක් සහිතව විෂයන් තුනකින් සමත්වීම සමග සාමාන්‍ය පොදු ප්‍රශ්න පත්‍රයට 30% කට නොඅඩු ලකුණු ප්‍රමාණයක් ලබා තිබීම සහ පාලි විෂය පිළිබඳ අවම වශයෙන් පහත සඳහන් සුදුසුකම්වලින් එකක්වත් සපුරා තිබීම.
   - i. **ප්‍රාචීන ප්‍රාරම්භ විභාගයේ පාලි විෂය සමත් වීම.**
   - ii. **මූලික පිරිවෙන් අවසාන විභාගයේ පාලි විෂය සමත් වීම.**
   - iii. **අ.පො.ස. (සා. පෙළ) විභාගයේ පාලි විෂය සමත් වීම.**
   - iv. **ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන පාලි ඩිප්ලෝමා පරීක්ෂණය සමත් වීම.**
   - v. **බෞද්ධ ධර්මාචාර්ය විභාගය සමත් වීම.**

**හෝ**

4. ප්‍රාචීන මධ්‍යම විභාගය සමග නියමිත වර්ෂයේ අ.පො.ස (උ. පෙළ) සමත්වීම සහ සාමාන්‍ය පොදු ප්‍රශ්න පත්‍රයට **ලකුණු** 30 **ක්** ලබා තිබීම.

**සංස්කෘත විශේෂ ප්‍රවේශය**

විශ්වවිද්‍යාලය තුළ සංස්කෘත පාඨමාලාව සඳහා ශිෂ්‍යයන් උනන්දු කරවීම අරමුණු කොට ඉහත සඳහන් වර්ෂවල පැවති අ.පො.ස. (උ. පෙළ) විභාගයෙන් සංස්කෘත විෂයට සාමාර්ථයක් සහිතව අදාළ ප්‍රවේශ සුදුසුකම් සපුරා ඇති ශිෂ්‍යයන්ගෙන් ද සීමිත සංඛ්‍යාවක් සංස්කෘත විෂය අනිවාර්ය කොට විශ්වවිද්‍යාලයට බඳවා ගනු ලැබේ. සංස්කෘත විෂය අනිවාර්ය කර බඳවා ගත් සිසුන් තම අධ්‍යයන කාලය තුළ ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) හෝ ශාස්ත්‍රවේදී (විශේෂ) පාඨමාලා සඳහා එම විෂයම හැදෑරිය යුතුය. එම කාලය තුළ වෙනත් පාඨමාලාවලට මාරු කරනු නොලැබේ.

**අයදුම්පත් ලබාගත හැකි ආකාරය :**

- **වෙබ් අඩවිය මගින් :**

  අයදුම්පත හා අදාළ විස්තර **www.bpu.ac.lk** යන බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය මගින් ලබාගත හැකිය. වෙබ් අඩවිය මගින් ලබා ගන්නා අයදුම්පත සම්පූර්ණ කර ඒ සමග හෝමාගම ලංකා බැංකු ශාඛාවේ, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයීය ගිණුම් අංක 711201ට බැර වන පරිදි රු. 500.00 ක් ගෙවා ලබාගන්නා ලද බැංකු කුවිතාන්සිය අමුණා ලියාපදිංචි තැපෑලෙන් 2021.06.25 දිනට පෙර පහත ලිපිනයට එවිය යුතුය.

  **සහකාර ලේඛකාධිකාරී (මහෝපාධ්‍යාය සම්බන්ධීකරණ හා ශිෂ්‍ය සේවා),**
  **ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,**
  **ගුරුළුගෝමී මාවත, පිටිපන උතුර, හෝමාගම.**
  **දුරකථන අංකය : 0112857786, 0112891104 / 071-0554530**

- **තැපැල් මගින් :**

  තැපැල් මගින් අයදුම්පත් ලබාගන්නේ නම්, හෝමාගම ලංකා බැංකු ශාඛාවේ, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයීය ගිණුම් අංක 711201 ට බැර වන පරිදි රු. 500.00 **ක්** ගෙවා ලබාගන්නා ලද බැංකු කුවිතාන්සිය සමග 10''X7'' ප්‍රමාණයේ තම නම සහ ලිපිනය ලියන ලද රු. 45.00 **ක** මුද්දර ඇලවූ ලියුම් කවරයක් ද සමග 2021/06/15 දිනට පෙර ලැබෙන සේ එවිය යුතුය. චෙක්පත් හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ. අයදුම්පත් ලබාගැනීම සඳහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"විශ්වවිද්‍යාල ප්‍රවේශය - 2021/ 2022"** යනුවෙන් සඳහන් කළ යුතුය.

  **අසම්පූර්ණ අයදුම්පත් සහ අයදුම්පත් භාර ගන්නා අවසන් දිනයෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

  සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2021/06/25 දිනට පෙර **ඉහත** සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"විශ්වවිද්‍යාලය ප්‍රවේශය - 2021/ 2022"** යනුවෙන් සඳහන් කළ යුතුය.

**සැ. යු.** *විශ්වවිද්‍යාලයට සිසුන් බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටියට සහ උපාධි ප්‍රදානයට අදාළ නීති රීතිවලට යටත්ව සිසුන් ලියාපදිංචි කරන බවද, පැවිදි ශිෂ්‍යයෙකු වශයෙන් ලියාපදිංචිය ලබාගත් පසු උපැවිදි වුවහොත් ශිෂ්‍ය භාවය හා ඊට හිමි සියලු වරප්‍රසාද අහිමි වන බවද, පැවිදි ශිෂ්‍යයෙක් උපාධි ප්‍රදානෝත්සවයට ප්‍රථම උපැවිදි වුවහොත් අනුපස්ථිතියෙහි පමණක් අදාළ උපාධිය ප්‍රදානය කරනු ලබන බවද පැවිදි නමින් පමණක් උපාධි සහතිකය ප්‍රදානය කරනු ලබන බවද සැලකිය යුතුය.*

**ලේඛකාධිකාරී, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,**
**පිටිපන උතුර, හෝමාගම.**
**2021.05.10**